2019.10.17 මව්බිම පිටු 1, 2

# ලෝක බැංකුව ලංකාවට අනතුරු අඟවයි

▶2 පිටුවට

ජයසූරිය උඩුකුඹුර

## දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය අඩුම දෙවැනි රට

## මෙහෙම ගියොත් අවුරුදු 23ක් යනකල් ගොඩ ඒමක් නෑ

## ලෝක බැංකුව ලංකාවට...

ශ්‍රී ලංකාවේ දැනට පවතින ආර්ථික වර්ධන වේගය තවදුරටත් මේ අයුරින්ම පැවැතුණහොත් මෙරට ආර්ථිකය දෙගුණයකින් වැඩි කර ගැනීමට තවත් වසර 23ක් පමණ ගතවනු ඇතැයි දකුණු ආසියාවේ මූර්ත දළ ජාතික නිෂ්පාදිතය පිළිබඳ වාර්තාවක් නිකුත් කරමින් ලෝක බැංකුව අනතුරු අඟවා තිබේ. දකුණු ආසියානු කලාපයේ රටවල් අතරින් දෙවැනි අඩුම ආර්ථික වර්ධන වේගය අත්පත් කරගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ බවද එම වාර්තා වේ සඳහන් වේ.

ඇෆ්ගනිස්තානයේ ආර්ථික වර්ධන වේගය සියයට 2.5ක් වන අතර ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 2.7ක් බවද එම වාර්තාව පෙන්වා දී ඇත. 2018 වර්ෂයේ මෙම අගය සියයට 3.2ක් ලෙස පැවැතිණි.

ආරක්ෂාව පිළිබඳ අභියෝග හා දේශපාලන අවිනිශ්චිතතාවන් පහවීමෙන් පසුව 2020දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 3.3ක් ලෙසද 2021 දී සියයට 3.7ක් ලෙසද සුළු වශයෙන් වර්ධනයවනු ඇති බවද ලෝක බැංකුව සිය වාර්තාවෙන් පුරෝකථනය කර තිබේ.